ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන අංශය
තරුණ කටයුතු පිළිබඳ උසස් ඩිප්ලෝමාව - 03 වන මට්ටම
අවසාන පරීක්ෂණය - පළමු අර්ධ වර්ෂය 2021/2022

**DSD3503 – ඉගෙනුම් ක්‍රියාවලිය**

කාලය: පැය දෙකයි (02)

දිනය : 25 - 06 -2022 වේලාව : ප.ව - 1.30 - ප.ව 3.30

උපදෙස් :

- ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 25 කි.
- පැහැදිලි අත් අකුරු අපේක්ෂා කෙරේ.

01. අ) "ඉගෙනුම" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පැහැදිලි කරන්න.

ආ) ඔබ අධ්‍යයනය කළ ඉගෙනුම් සිද්ධාන්තයන් ආශ්‍රයෙන් ඉගෙනුම සිදුවන ආකාරය සාකච්ඡා කරන්න.

හෝ

තරුණ සංවර්ධන ක්‍රියාකාරිකයෙකු ලෙස ඔබගේ ක්‍රියාකාරිත්වය සඳහා මානවවාදී න්‍යායන් ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි විමර්ශනය කරන්න.

02. "අවිධිමත් අධ්‍යාපනය පෞරුෂ වර්ධනයට දායක වේ" පැහැදිලි කරන්න.

හෝ

අ) විධිමත් හා අවිධිමත් අධ්‍යාපනය අතර ඇති වෙනස්කම් ලැයිස්තුගත කරන්න.

ආ) විධිමත් නොවන අධ්‍යාපනය වැඩිහිටියන්ගේ ඉගෙනීමට උපකාරී වන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

03. ඉගෙනීම සඳහා වන ත්‍රිවිධාකාර අධ්‍යාපන ක්‍රම පිළිබඳ විස්තර කරන්න.

04. අ) ඉගෙනීමට උපකාර වන පරිසරයක තිබිය යුතු ගති ලක්ෂණ මොනවාද?

ආ) පහසුකම් සපයන්නෙකු (Facilitator) සතු තාක්ෂණික සහ ඉගැන්වීමේ ශෛලීන් මොනවාද?

05. "යාව ජීව ඉගෙනීම" (Life- Long Learning) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? තරුණ සංවර්ධන සන්දර්භය තුළ "යාව ජීව ඉගෙනීමෙහි" වැදගත්කම පරීක්ෂා කරන්න.

හෝ

විවිධ ඉගැන්වීම් ශෛලීන් මෙන්ම විවිධ ඉගෙනුම් ශෛලීන් ද දක්නට ඇත. සිසුන් කණ්ඩායමක් සඳහා යෝග්‍ය වන්නා වූ විවිධ ඉගැන්වීම් ශෛලීන් මිශ්‍රණයක් භාවිතා කිරීමේ වැදගත්කම උදාහරණ උපුටා දක්වමින් විස්තර කරන්න.

06. අ) කාල් රොජර්ස් විසින් හඳුනාගනු ලැබූ අත්දැකීම් සහිත ඉගෙනීම සඳහා මූලික වන මූලධර්ම පහක් සඳහන් කරන්න.

ආ) තරුණ සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී ඉහත මූලධර්මවලින් දෙකක් (02) යොදා ගත හැකි ආකාරය කෙටියෙන් සාකච්ඡා කරන්න.

07. පහත සඳහන් ඕනෑම මාතෘකා තුනක් (03) සඳහා කෙටි සටහන් ලියන්න.

අ) මනස තුළ ස්වයංක්‍රීය පද්ධතීන්

ආ) වැඩිහිටි ඉගෙනුම් මූලධර්ම

ඇ) අධ්‍යාපනික අභිමතාර්ථ පිළිබඳ බ්ලූම් ගේ වර්ගීකරණය

ඈ) අත්දැකීම් පාදක වූ ඉගෙනීම

ඉ) මාස්ලෝස්ගේ අවශ්‍යතා ධූරාවලිය

********** සියළුම හිමිකම් ඇවිරිණි************